සියලුම හිමිකම් ඇවිරිණි. *All Right Reserved*

බෞද්ධ ශිෂ්ටාචාරය - කලාප අධ්‍යාපන කාර්යාලය බෞද්ධ ශිෂ්ටාචාරය - කලාප අධ්‍යාපන කාර්යාලය

බෞද්ධ ශිෂ්ටාචාරය - කලාප අධ්‍යාපන කාර්යාලය බෞද්ධ ශිෂ්ටාචාරය - කලාප අධ්‍යාපන කාර්යාලය
බෞද්ධ ශිෂ්ටාචාරය - කලාප අධ්‍යාපන කාර්යාලය බෞද්ධ ශිෂ්ටාචාරය - කලාප අධ්‍යාපන කාර්යාලය
බෞද්ධ ශිෂ්ටාචාරය - කලාප අධ්‍යාපන කාර්යාලය බෞද්ධ ශිෂ්ටාචාරය - කලාප අධ්‍යාපන කාර්යාලය

45 | S | I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2020 - පෙරහුරු ප්‍රශ්න පත්‍ර
General Certificate of Education ( Adv.Level ) Examination ,

බෞද්ධ ශිෂ්ටාචාරය - I

පැය දෙකයි
TWo hours

01. කුලවාදය භාරතීය සමාජයේ තහවුරු කිරීම සඳහා බ්‍රාහ්මණයන් විසින් යොදාගත් ප්‍රධානතම ආගමික ඉගැන්වීම් වූයේ,

(1) වර්ණ ධර්මයයි. (2) ආශ්‍රම ධර්මයයි. (3) ස්වධර්මයයි.
(4) ආපද් ධර්මයයි. (5) යාගයයි.

02. වෘත්තිය අයිතිවාසිකම් වෙනුවෙන් නැඟී සිටීමට ඈත අතීතයේ සිටම ජනතාව පෙළඹී තිබේ.භාරතීය ස්වදේශීය ජනතාවගේ වෘත්තීය නිදහස සීමා කිරීමට බමුණන් විසින් යොදා ගත් ප්‍රමුඛ ඉගැන්වීම වූයේ,

(1) කුල භේදයයි. (2) ආශ්‍රම ධර්ම න්‍යායයි.
(3) කුලහීනයන්ට අධ්‍යාපනය තහනම් කිරීමයි. (4) ස්වධර්ම නයායයි.
(5) පූජක ඒකාධිකාරයයි.

03. භාරතීය ආගමික හා දාර්ශනික පරිසරය තුළ ශ්‍රමණ සම්ප්‍රදාය බිහි වූයේ බ්‍රාහ්මණ ඉගැන්වීම් ප්‍රතික්ෂේප කරමින් ඊට ප්‍රතිචාරයක් වශයෙනි. එහෙත් ඇතැම් බ්‍රාහ්මණ ඉගැන්වීම් ශ්‍රමණ සම්ප්‍රදාය විසින් සපුරා ප්‍රතික්ෂේප නොකරන ලද බව ද ෂට් ශාස්තෘන්ගේ ඉගැන්වීම් පරීක්ෂා කිරීමෙන් පැහැදිලි වේ. මේ අනුව ඇතැම් ශ්‍රමණයන් විසින් ද පිළිගත් බ්‍රාහ්මණ ඉගැන්වීමක් ලෙස හඳුනා ගත හැක්කේ,

(1) ඊශ්වර නිර්මාණවාදය යි. (2) කුල භේදයයි. (3) නිදහස් චින්තනයයි.
(4) යාගයයි. (5) කර්ම විපාක පිළිගැනීමයි.

04. බුද්ධ කාලීන භාරතයේ ආගමික සංවිධාන පැවති අතර ශ්‍රමණ සම්ප්‍රදාය ඉන් ප්‍රමුඛ වේ. ඔවුන් අතර විවිධ දාර්ශනික සංකල්ප ඉදිරිපත් කළ ප්‍රකට ශාස්තෘවරුන් විසූ බව සාමඤ්ඤඵල සූත්‍රය ආදී මූලාශ්‍රයන්හි දැක්වේ.එකී තොරතුරුවලට අනුව පූර්ණ කස්සප ආචාර්යවරයා විසින් ඉදිරිපත් කරන ලද දර්ශනවාදය ලෙස සැලකෙන්නේ,

(1) අමරාවික්ඛේපවාදයයි. (2) නියතිවාදයයි. (3) අකිරිය වාදයයි.
(4) පුබ්බේකතහේතුවාදයයි. (5) අධිච්චසමුප්පන්නවාදයයි.

05. "නත්ථි මහාරාජ හේතු, නත්ථි පච්චයෝ සත්තානං සංකිලේසාය අහේතු අප්පච්චායා, සත්තා සංකිලිස්සන්ති නත්ථි හේතු නතුථි පච්චයෝ සත්තානං විසුද්ධියා.........." යනාදි ඉගැන්වීම් ඉදිරිපත් කළ ශාස්තෘවරයා වූයේ,

(1) අජිත කේශකම්බලී ය. (2) මක්ඛලී ගෝසාලය. (3) පූර්ණ කස්සපය.
(4) පකුධ කච්චායනය. (5) සංජය බෙල්ලට්ඨිපුත්තය.

06. බුද්ධකාලීන භාරතයේ පැවති සොළොස් මහා ජනපද අතරින් උතුරෙන් ගංගා නදිය ද නැගෙනහිරින් චම්පා නදිය ද නිරිත දිගින් වින්ද්‍යා කඳු වැටිය ද බටහිරින් සෝණ නදිය ද සීමා කොට ගත් රාජ්‍යය වූයේ,

(1) කෝසල රාජ්‍යය. (2) මගධ රාජ්‍යය. (3) වත්ස රාජ්‍යය.
(4) අවන්ති රාජ්‍යය. (5) කාසි රාජ්‍යය.

07. බුද්ධ ශ්‍රාවක භික්ෂුන්ගෙන් ධර්මය අසා තෙරුවන් සරණ ගිය බෝහෝ රජවරු බුද්ධ කාලීන භාරතයේ විසූහ. ඒ අතරින් උදේනි රජතුමා තෙරුවන් සරණ ගියේ,

(1) මහා කච්චායන තෙරුන්ගෙන් ධර්මය ඇසීමෙනි.
(2) අස්සජි තෙරුන්ගෙන් ධර්මය ඇසීමෙනි.
(3) පිණ්ඩෝල භාරද්වාජ තෙරුන්ගෙන් ධර්මය ඇසීමෙනි.
(4) සැරියුත් තෙරුන්ගෙන් ධර්මය ඇසීමෙනි.
(5) මුගලන් තෙරුන්ගෙන් ධර්මය ඇසීමෙනි.

08. ලෝකය ස්වාභාව වශයෙන් ද සමුදය වශයෙන් ද නිරෝධ වශයෙන් ද මාර්ග වශයෙන් ද සියලු ආකාරයෙන් තමන් විසින්ම අවබෝධ කළ බැවින් බුදුරජාණන් වහන්සේ සුවිශේෂ ගුණයකින් යුක්ත විය. එම ගුණය හැඳින්වෙන්නේ,

(1) බුද්ධ බුදු ගුණය යනුවෙනි. (2) සම්මා සම්බුද්ධ බුදු ගුණය යනුවෙනි.
(3) සුගත බුදු ගුණය යනුවෙනි. (4) ලෝකවිදූ බුදු ගුණය යනුවෙනි.
(5) භගවා බුදු ගුණය යනුවෙනි.

09. ක්‍රි.පූ.6වන සියවසේ ලොව පහළ වූ ශ්‍රේෂ්ඨතම ගුරුවරයා ලෙස ගෞතම බුදුරජාණන් වහන්සේ සලකනු ලබයි. උන්වහන්සේ ධර්ම දේශනා කිරීමේදී තමා වෙත පැමිණෙන ප්‍රශ්න, ක්‍රම හතරකට විසඳූ බව දැක්වේ. එහිලා පටිපුච්ඡා ව්‍යාකරණ ක්‍රමය යනුවෙන් හැඳින්වෙන්නේ,

(1) ඍජු පිළිතුරු සැපයීමේ ක්‍රමය යි.
(2) විශ්ලේෂණාත්මක පිළිතුරු සැපයීමේ ක්‍රමය යි.
(3) ප්‍රති ප්‍රශ්න අසා පිළිතුරු සැපයීමේ ක්‍රමය යි.
(4) පිළිතුරු නොදී නිහඬ ව සිටීමේ ක්‍රමය යි.
(5) තමන් වහන්සේගේ අදහසට අනුව පිළිතුරු සැපයීමේ ක්‍රමය යි.

10. බුදු රජාණන් වහන්සේ භික්ෂු භික්ෂුණීන් වහන්සේලාගේ විවිධ කුසලතා අගයමින් අග තනතුරු පිරිනැමූ බවට ශාසන ඉතිහාසය සාක්ෂි දරයි. ඒ අනුව ධර්මඥානය හා අත්දැකීම් බහුලත්වය නිසා විරරාත්‍රඥ භික්ෂුණීන් අතර අගතනතුරට පත් වූයේ,

(1) ඛේමා රහත් තෙරණින් වහන්සේ ය.
(2) උප්පලවණ්ණා රහත් තෙරණින් වහන්සේ ය.
(3) පටාචාරා රහත් තෙරණින් වහන්සේ ය.
(4) මහා ප්‍රජාපතී රහත් තෙරණින් වහන්සේ ය.
(5) කිසාගෝතමී රහත් තෙරණින් වහන්සේ ය.

11. බුද්ධකාලීන ඇතැම් භික්ෂු භික්ෂුණීන් අතින් සිදු වූ ශාසන විරෝධි ක්‍රියා නිසා බුදු සසුනේ චිරස්ථිතිය වෙනුවෙන් විනය ශික්ෂාපද පනවන ලදී. කම්මක්ඛන්ධයෙහි එවැනි සුවිශේෂ විනය නිති පද්ධතියක් දක්නට ලැබේ. ධර්මඥානයෙන් පිරිපුන් සැදැහැවත් උපාසකයෙකුට ගැරහීම නිසා සුධම්ම නම් භික්ෂුවට බුදුරදුන් විසින් පටිසාරණීය කර්මය නම් දණ්ඩනය පනවන ලද බව එහි සඳහන් වේ. එම සිද්ධියට මුල් වූ උපාසකතුමා වූයේ,

(1) චිත්ත ගහපතිතුමා ය. (2) නකුල පිතා ය. (3) අනේපිඬු සිටුතුමා ය.
(4) ධනංජය සිටුතුමා ය. (5) මිගාර සිටුතුමා ය.

12. එක්තරා පාසලක අ.පො.ස (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල නිකුත් වූ විට සිසුන් අතර ඇති වූ කතාබහක් පහත දැක්වෙන අතර එයින් පුද්ගල ස්වාමිත්වය පිළිඹිබු වන ප්‍රකාශය වන්නේ,

(1) "දෙයියන්ගේ පිහිටෙන් මම නම් විභාගෙ පාස් " යන්න යි.
(2) "හිතුවෙවත් නැති විදියට මාත් පාස් " යන්න යි.
(3) "විභාගෙට හොඳින් සූදානම් වූ නිසා හොඳ සාමාර්තයක් මට ලැබුණා " යන්න යි.
(4) "කරුමයක් පල දීලා වෙන්නැයි මම ෆේල් " යන්න යි.
(5) "මම නම් පාස් වුණේ සරත් සර්ගේ පිහිටෙන් " යන්නයි.

13. සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ආකල්පය පැහැදිලි කරන දීඝ නිකාය ගත අග්ගඤ්ඤ සූත්‍රයට අනුව විවිධ හේතු කරණ කොට ගෙන සමාජය පරිණාමයට පත්වීමෙන් පවුල ද කුල ක්‍රමය ද රාජ්‍යය ද ඇතුළත් සමස්ත සමාජය නිර්මාණය විය. එම විස්තරයට අනුව සමාජ නිර්මාණයෙහිලා බුදු සමය අවධාරණය කරන ප්‍රධාන සාධකය ලෙස හඳුනාගත හැක්කේ,

(1) කර්ම විපාක සිද්ධාන්තය යි. (2) ස්වාභාවවාදය යි. (3) නිර්මාණවාදය යි.
(4) නියතිවාදය යි. (5) හේතුඵලවාදය යි.

14. සමාජයේ දුගීභාවය දුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීමත්, අපරාධ මර්ධනය කොට සමාජය තුළ සාමය පවත්වාගෙන යාමත්, සිල්වත් ගුණවත් බහුශ්‍රැත උතුමන්ගෙන් අවවාද අනුශාසනා ලබා ගැනීමත් යන උපදේශ ඇතුළත් බෞද්ධ දේශපාලන මූලධාර්මය,

(1) දස සක්විති වත යි. (2) සප්ත අපරිහානීය ධර්මය යි.
(3) දස රාජ ධර්මය යි. (4) කූටදන්ත සූත්‍රාගත දේශපාලන න්‍යාය යි.
(5) පංච ශීලය යි.

15. පහත සඳහන් කරුණු අතරින් හොඳ නරක විනිශ්චයෙහි ලා නිර්ණායකයක් ලෙස සැලකිය නො හැක්කේ,

(1) කැඩපතෙන් තමාම තම සිරුර ප්‍රත්‍යවේක්ෂා කරන්නා සේ තම කායික, වාචසික, මානසික ක්‍රියා ප්‍රත්‍යවේක්ෂණය කළ යුතු ය යන්න යි.
(2) තමා උපමා කොට අනුන්ට හිංසා පීඩා නො කළ යුතු ය යන්න යි.
(3) මෙලොව පරලොව වශයෙන් විපාකය පිළිබඳ විමසා කටයුතු කළ යුතු ය යන්න යි.
(4) තමා පිළිබඳ, සමාජය පිළිබඳ, ධර්මය පිළිබඳ සලකා බලා කටයුතු කළ යුතු ය යන්න යි.
(5) සියලු සංස්කාරයෝ නැසෙන සුළු හෙයින් අප්‍රමාදීව කටයුතු කළ යුතු ය යන්න යි.

16. පින් පව්, කුසල් අකුසල් හැඳින ගනිමින් හොඳ නරක විනිශ්චය කිරීමෙහි ලා භාවිත බෞද්ධ නිර්ණායක ගණයට ඇතුළත් ධම්ම පද දේශනාව වනුයේ,

(1) මෝඩයා තමා කළ පව් මෝරා විපාක දෙනතෙක් එය මී පැණි මෙන් සලක යි යන්න යි.
(2) තමාට අහිත වූ අයහපත් දේ ලෙහෙසියෙන් කළ හැකිය යන්න යි.
(3) ක්‍රෝධ නොකිරීමෙන් දිනිය යුතුය යන්න යි.
(4) පසුතැවීමෙන් කඳුලු පිරි දෙනෙතින් විපාක විඳීමට සිදුවන ක්‍රියා නො කිරීම මැනවි යන්න යි.
(5) අසත් පුරුෂයා සත් පුරුෂකමින් දිනිය යුතුය යන්න යි.

17. අවිවාහක දැහැමි ජීවිතයක් ගත කළ ධර්මසේන මහතා පසු ගිය දින හදිසි හෘදයාබාධයකින් මිය ගියේ ය. එය ප්‍රාදේශයේ බොහෝ දෙනාගේ සංවේගයට හේතු විය. ඔහුගේ අවමංගල උත්සවයේදී විහාරස්ථානයෙන් විහාරාධිපති හිමිපාණෝ දීර්ඝ අනුශාසනාවක් කළහ. "ධර්මසේන මහතා පින් පව් හොඳින් තේරුම් ගෙන, ලජ්ජා බය ඇතිව ජීවත් වූ අයෙක්, එතුමා කිසි විටෙකත් අනුන්ගේ කිසිම දෙයක් සොර සිතින් ලබා ගත්තේ නැහැ. කුරා කුහුඹියෙකුගේ වත් ජීවිතයක් විනාශ කිරීමට බය වූ අයෙක්, කඩපිල් ගානේ ඕප දූප කියමින් කාලෙ කා දැම්මේ නැහැ. හැකි හැම විටම අනුන්ට උදව් කරමින් සමඟියෙන් ජීවත් වුණා. කෙනෙකුගේ දුකකදී කරදරයකදී ඔහු සැම විටම තම ධනය ඒ වෙනුවෙන් කැප කලේ නිර්ලෝභීවයි. ආගමට දහමට ලැදිව, තෙරුවන් කෙරෙහි පැහැදීමෙන් කර්මඵල විශ්වාස කරගෙන කටයුතු කළා " යනාදී වශයෙන් ඔහුගේ ගුණ වර්ණනා කොට නිවන් සුව ප්‍රාර්ථනා කළහ. මේ ප්‍රකාශයෙහි දස කුසල්වලට ගැනෙන කරුණු.

(1) තුනක් ඇතුළත් වේ. (2) හතරක් ඇතුළත් වේ. (3) පහක් ඇතුළත් වේ.
(4) අටක් ඇතුළත් වේ. (5) දහයක් ඇතුළත් වේ.

18. රුවන්ගිරි මධ්‍ය මහා විද්‍යාලයේ බෞද්ධ ශිෂ්‍ය සංගමයේ රැස්වීම මසකට වරක් පැවැත් වෙයි. එහිදී විදුහල්පතිතුමා අනුශාසනාවක් පවත්වමින්,
"ගුණ ගරුක යහපත් දරුවන් වීමට නම් තමා වරදින් වැලකී, අනුන් වරදින් වලක්වා, අනුන් කරන වරදට අනුබල නොදී කටයුතු කළ යුතු බවත් එම අවබෝධය ඇති දරුවා තමන්ටත් අනුන්ටත් වරදක් නොකරන බවත් " සඳහන් කෙළේය. මේ තුළින් කියැවෙන බෞද්ධ සදාචාර මූලධර්මය වන්නේ,

(1) අත්තූපනායක ධර්ම පර්යාය යි. (2) ත්‍රිකෝටි පාරිශුද්ධි සීලය යි. (3) පංචසීල ප්‍රතිපත්තිය යි.
(4) ත්‍රිවිධ අධිපති ධර්මය යි. (5) විරතිය හා සමාදානය යි.

19. පුද්ගල චර්යා පාලනය කිරිමෙහි ලා නීතිය ප්‍රබල සාධකයකි. නීතිය සමාජ සම්මතයකි. එම සම්මතයන් නො ඉක්මවා ක්‍රියා කිරිම බුදු සමය තුළ වැදගත්කොට සලකා තිබේ. මේ අදහස ඉස්මතු වන බෞද්ධ මූලධර්මය වන්නේ,

(1) සප්ත ආර්ය ධනය යි. (2) දස රාජ ධර්මය යි. (3) සතර බ්‍රහ්ම විහරණය යි.
(4) සතර සංග්‍රහ වස්තුව යි. (5) සප්ත අපරිහානී ධර්මය යි.

20. ජීවත් වීමේ අයිතිය, සම්පත් රැක ගැනීමේ අයිතිය, සාර්ථක පවුල් ජීවිතයක් ගත කිරීමේ අයිතිය මෙන්ම සමාජය තුළ විශ්වාසයත්, සහජීවනයත් ස්ථාපිත කිරීමට අනුබල දෙන මූලික බෞද්ධ ඉගැන්වීමක් ලෙස හඳුනා ගත හැක්කේ,

(1) බෝධිසත්ත්ව ප්‍රතිපදාව යි. (2) නිර්වාණගාමී මාර්ගය යි. (3) සම්මා අජීවය යි.
(4) පංචශීල ප්‍රතිපදාව යි. (5) අත්තූපනායික ධර්ම පර්යාය යි.

21. සෞන්දර්ය රසාස්වාදය බුදුසමයට අනුචිත නො වුවකි. තථාගතයන් වහන්සේ මෙන්ම විරාගී යතිවරුන් ද නිරාමිස සෞන්දර්යාස්වාදය කළ බෞද්ධ මූලාශ්‍රය තුළ දක්නට ලැබේ. එහි සෞන්දර්ය රසාස්වාදයේ මූලිකම පදනම ලෙස දක්වා ඇත්තේ,

(1) ප්‍රසාදය හා නිර්වේදය ඉපදවීම යි. (2) සුඛස්වාදය ජනිත කරවීම යි.
(3) ඉන්ද්‍රිය පිනවීම යි. (4) ආමිස සුවය විඳ ගැනීම යි.
(5) විරාගය ඇති කිරීම යි.

22. "දැහැමි ව උපයා ගන්නා ලද ධනය අර්ථාන්විත ව පරිභෝජනය කළ යුතු ය." යන්න බෞද්ධ ඉගැන්වීමයි. එහිලා බුදු සමය විවිධ පරිභෝජනය සිද්ධාන්ත ඉදිරිපත් කොට ඇති අතර පංචබලි සංකල්පය ද ඒ අතර ප්‍රමුඛ ඉගැන්වීමකි. එහි "අතීති බලි" යනුවෙන් හැඳින්වෙන්නේ,

(1) ඥාතීන් විෂයයෙහි යුතුකම් ඉටු කිරීම යි. (2) ආගන්තුකයින් විෂයයෙහි යුතුකම් ඉටු කිරීම යි.
(3) වැඩිහිටියන් විෂයයෙහි යුතුකම් ඉටු කිරීම යි. (4) ආගම විෂයෙහි යුතුකම් ඉටු කිරීම යි.
(5) මිය ගිය ඥාතීන් විෂයයෙහි යුතුකම් ඉටු කිරීම යි.

23. "නිවැරදි කාය වාග් මන: කර්මයන්ගෙන් යුක්ත වූ ආර්ය ශ්‍රාවකයා සැපයට පැමිනෙයි. සොම්නසට පැමිණෙයි." අනණ සූත්‍ර ගත ඉහත සැපය හඳුන්වන්න.

(1) අත්ථි සුඛ ලෙස ය. (2) භෝග සුඛ ලෙස ය. (3) අනණ සුඛ ලෙස ය.
(4) අනවජ්ජ සුඛ ලෙස ය. (5) නිරාමිස සුඛ ලෙස ය.

24. සිගාල ගෘහපති පුත්‍රයා පියාගේ අවවාදය අනුව අළුයම පිබිදී දිය නා පිරිසිදු වී සිදු කළ දිසා නමස්කාරය දුටු බුදුරජාණන් වහන්සේ එම ක්‍රියාව අර්ථ ශූන්‍යබවත්, නිසි පරිදි සදිසා වන්දනය යනු ස්ථායී සංස්ථාවන් උදෙසා යුතුකම් හා වගකීම් ඉටු කිරීම බවත් පෙන්වා දුන්නහ. ඒ අනුව දකුණු දිශාවෙන් නියෝජනය වන්නේ,

(1) මහණ බමුණන් ය. (2) මවුපියන් ය. (3) අඹු දරුවන් ය.
(4) ගුරුවරුන් ය. (5) මිතුරන් ය.

25. "ධර්මයට කැමති වන්නා දියුණුවට පත් වේ. ධර්මය අකමැති වන්නා පිරිහීමට පත්වේ." යනුවෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. එම දේශනාව අන්තර්ගත වන්නේ,

(1) වසල සූත්‍රය යි. (2) පරාභව සූත්‍රය යි. (3) වේළුද්වාර සූත්‍රය යි.
(4) මංගල සූත්‍රය යි. (5) බාලපණ්ඩිත සූත්‍රය යි.

26. බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩ වාසය කරද්දී එක්තරා දේවතාවක් උන්වහන්සේ හමුවට පැමිණ මංගල කරුණු කවරේ දැයි ප්‍රශ්ණ කලවිට මංගල සූත්‍රය දේශනා කළහ. එම සූත්‍රයෙහි මංගල කරුණු 38ක් අන්තර්ගත වන අතර ඉන් එක් මංගල කරුණක් වන්නේ,

(1) ඉවසීම යි. (2) මෛත්‍රිය යි. (3) සත්‍යවාදී බව යි.
(4) උත්සාහය යි. (5) කරුණාව යි.

27. **න පරෙසං විලෝමානි - න පරෙසං කතාකතං**

**අත්තනාව අවෙක්ඛෙය්‍ය - කතානි අකතානි ච**

මෙම ධම්මපද ගාථාවෙන් අදහස වන්නේ,

(1) අනුන්ගේ පිහිට නොපතා තමාට තමාම පිහිට විය යුතු බව ය.
(2) අනුන්ගේ කටයුතු ගැන නො සොයා තමන්ගේ කටයුතු ගැන සෙවිය යුතු බව ය.
(3) තමන් උපමා කොට අනුන්ට හිංසා නොකළ යුතු බව ය.
(4) තමාගේ මෙන්ම මෙරමාගේ යහපත උදෙසා කටයුතු කළ යුතු බව ය.
(5) තමාට මෙන්ම අනුන්ටද ධර්මය හැර පිහිටක් නැති බව ය.

28. "ජිනෙ කදරියං දානේන" - යන ගාථා පදයෙන් කියැවෙන ධර්මෝපදේශ වන්නේ,

(1) ක්‍රෝධ කරන්නා ක්‍රෝධ නොකිරීමෙන් දිනන්නේ ය යන්න යි.
(2) හිංසා කරන්නා මෛත්‍රියෙන් දිනන්නේ ය යන්න යි.
(3) තද මසුරා තමා සතු දෑ දීමෙන් දිනන්නේ යන්න යි.
(4) බොරු කියන්නා සත්‍ය කීමෙන් දිනන්නේය යන්න යි.
(5) අයහපත් පුද්ගලයා යහපතින් දිනන්නේය යන්න යි.

29. සම්මා ධර්ම සංගායනාවේදී ආනන්ද තෙරුන්ට චෝදනා පහක් එල්ල විය. බුදුරජාණන් වහන්සේට වැසි සළුවක් මැසීම හෝ සම්බන්ධ චෝදනාවක් ද ඒ අතර විය. උන්වහන්සේට එම චෝදනාව එල්ල වුයේ,

(1) බුදුරදුන්ගේ ම අදහසකට අනුව ය.
(2) රහත් හැට නමගේ ඉල්ලීමට අනුව ය.
(3) සහම්පතී බ්‍රහ්මයාගේ ඉල්ලීමට අනුව ය.
(4) පස්වග මහණුන්ගේ ඉල්ලීමට අනුව ය.
(5) බිම්බිසාර රජුගේ ඉල්ලීමට අනුව ය.

30. ප්‍රථම ධර්ම සංගායනාවේදී ආනන්ද තෙරුන්ට චෝදනා පහක් එල්ල විය. බුදුරජාණන් වහන්සේට වැසි සළුවක් මැසිම හෝ සම්බන්ධ චෝදනාවක් ද ඒ අතර විය. උන්වහන්සේට එම චෝදනාව එල්ල වුයේ,

(1) වැසි සළුව සඳහා සුදුසු වස්ත්‍රයක් භාවිතා නොකිරීම හේතුවෙනි.
(2) මාගමක් ලවා වැසි සළුව මැස්ස වීම හේතුවෙනි.
(3) සළු මැසීම භික්ෂුන්ට අකැප වීම හේතුවෙනි.
(4) සළු මසා භාවිතයට ගැනිම බුදුරදුන් අනුමත නොකර තිබීම හේතුවෙනි.
(5) පයින් මැඩ ගෙන වැසි සළුව මැසීම හේතුවෙනි.

31. තමන් වහන්සේගේ ඇවෑමෙන් පසු ඡන්න හිමියන්ට බ්‍රහ්මදණ්ඩනය පන වන්න යැයි බුදුරදුන් කරන ලද නියමයට අනුව ප්‍රථම සංගීතිකාරක තෙරවරු උන්වහන්සේට බ්‍රහ්මදණ්ඩය පැනවීමට තීරණය කළහ. බ්‍රහ්මදණ්ඩයේ ස්වභාවය ඇසු ඡන්ද හිමියන් සිහි සුන්ව ඇද වැටුණි. එහි දැක්වෙන බ්‍රහ්මදණ්ඩය යනු,

(1) වැඩ වසන ආරාමයෙන් නෙරපීම යි.
(2) වැඩ වසන ග්‍රාමයෙන් නෙරපීම යි.
(3) සිවුරු හරවා ගිහි බවට පත් කරවීම යි.
(4) කිසිදු ශාසනික කටයුත්තකට සහභාගි කරවා නොගැනීම යි.
(5) කථා නොකිරීමත් අවවාද අනුශාසනා නොකිරීමත් මගින් බැහැර කිරීම යි.

32. කාලාශෝක රාජ්‍ය සමයේ සිදුකරන ලද දෙවන ධර්ම සංගීතියේ දී නිෂ්ප්‍රභා කරන ලද දස අකැප වස්තුවේ දැක්වෙන "අමථිත කප්ප" යනුවෙන් අදහස් කරන ලද්දේ,

(1) නො පැසුණු සුරා පානය කිරීම කැප බව ය.
(2) වාටි නො මැසු ඇතිරිලි භාවිතය කැප බව ය.
(3) කිරිත් නොවූ දීකිරිත් නොවූ කිරි වැළදීම කැප බව ය.
(4) ආචාර්ය පරම්පරාවෙන් පැවත එන චිරාගත දේ හොඳ වුව ද, නරක වුව ද, එලෙසින් ම පිළිපැදීම කැප බව ය.
(5) පසුව අනුමැතිය ගැනීමේ අටියෙන් සංඝ කර්ම කිරීම කැප බව ය.

33. අශෝක රාජ්‍ය සමය වන විට විවිධ හේතු සාධක කරණකොට ගෙන බුදු සසුන පරිහානියට පත්වෙමින් පැවති බව ඓතිහාසික වාර්තාවන්ගෙන් සනාථ වේ. ඒ සඳහා බලපෑ ප්‍රමුඛතම හේතුව ලෙස සැලකිය හැක්කේ,

(1) බ්‍රාහ්මණ ආගම බලවත්වීම ය.
(2) භික්ෂූන් වහන්සේලා ලාභ සත්කාරවලට ගිජු වීම ය.
(3) ලාභ සත්කාර අපේක්ෂාවෙන් අන්‍ය තීර්ථකයන් සසුනට ඇතුළත්ව සිටීම යි.
(4) රාජානුග්‍රහය නිසි පරිදි නොලැබීම ය.
(5) භික්ෂූන් වහන්සේලා පොහොය කර්ම නොකර සිටීම ය.

34. ක්‍රි.ව.දෙවන හා තුන්වන සියවස්වල භාරතයේ ප්‍රකට විශ්ව විද්‍යාල කිහිපයක් බිහි වූ බව මූලාශ්‍රයන්හි සඳහන් වේ. නාලන්දා විශ්ව විද්‍යාලය ද ඒ අතර ප්‍රමුඛ වේ. මෙම විශ්ව විද්‍යාලය බිහි කිරීමේ ගෞරවය හිමි වන්නේ,

(1) තථාගත ගුප්ත රජතුමාට ය. (2) බාලාදිත්‍ය රජතුමාට ය. (3) වික්‍රමාදිත්‍ය රජතුමාට ය.
(4) ශක්‍රාදිත්‍ය රජතුමාට ය. (5) නරසිංහගුප්ත රජතුමාට ය.

35. ප්‍රාග් බෞද්ධ යුගයේ ලාංකික ජනයා දෙවියන් ඇදහීම සිදු කළ බවත්, පණ්ඩුකාභය රජතුමා විවිධ දෙවිවරුන් සඳහා අනුග්‍රහ දැක්වූ බවත් මහාවංසාදි ඓතිහාසික වාර්තා මගින් සනාථ වේ. එම වාර්තාවලට අනුව එකල ජනයා විසින් දඩයමට අධිපති දෙවියා ලෙස සලකන ලද්දේ,

(1) වෙස්සවණ ය. (2) පුලින්ඩර ය. (3) කම්මාර ය.
(4) ව්‍යාධ ය. (5) පුරදේව ය.

36. බුදු දහම පැමිණෙන්නට පෙර ලක්දිව බොහෝ ආගමික ඇදහිලි හා විශ්වාස පැවතිණ. එම ඇදහිලි හා විශ්වාසයන්ට අනුග්‍රහ දැක් වූ රජෙකු ලෙස පණ්ඩුකාභය රජු හඳුනාගත හැකිය. රජු ආගමික කටයුතු ඉටු කිරීමට පහසුකම් සපයා දීමක් ලෙස "සොත්ථි ශාලා" නම් ගොඩනැගිලි විශේෂයක් කරවා දුන් බව මහා වංසයේ සඳහන් වේ. එම ගොඩනැගිලි විශේෂය තනවා දෙන ලදැයි සැලකෙන්නේ,

(1) බ්‍රාහ්මණයන් උදෙසා ය. (2) පරිබ්‍රාජකයන් උදෙසා ය. (3) නිගණ්ඨයන් උදෙසා ය.
(4) ආජීවකයන් උදෙසා ය. (5) තාපසයන් උදෙසා ය.

37. සුවිශේෂී වූ පුණ්‍ය කර්ම දහයක් දස පුණ්‍යක්‍රියා ලෙස බුදු දහමෙහි හඳුන්වා දී ඇත. ඒ අතර "අපචායන" යනුවෙන් අදහස් කරන්නේ,

(1) පින්දීමයි. (2) නිවැරදි දැක්මයි. (3) වතාවත් කිරීමයි.
(4) ධර්ම ශ්‍රවණයයි. (5) පිදිය යුත්තන් පිදීමයි.

38. පක්ෂීන් සිවුපාවුන් සහිත සියලු ජනතාවට රැකවරණය සලසමින්, අපරාධ මර්ධනය කිරීමත්, ආර්ථික සුරක්ෂිතතාව ඇති කිරීමත්, පූජනීය විශාරදයන්ගෙන් උපදෙස් ලබාගැනීමත්, ඉහළම ප්‍රතිපත්ති ගරුක පාලකයකුගේ ලක්ෂණයකි. ඒ සියලු අරමුණු ඇතුළත් බෞද්ධ දේශපාලන මූලධර්මය වන්නේ,

(1) සප්ත අපරිහානි ධර්මයන්ය. (2) දස සක්විතිවත්ය.
(3) සතර සංග්‍රහ වස්තුවයි. (4) පංචසීල ප්‍රතිපත්තියයි.
(5) දසරාජ ධර්මයයි.

39. බෞද්ධ මූලාශ්‍රවල සඳහන් කරුණු අනුව මිනිසා අපරාධවලට පොළඹවන ප්‍රධානතම හේතුවක් වන්නේ,

(1) මත්ද්‍රව්‍ය භාවිතයයි. (2) තරහකාරී බවයි. (3) නූගත්කමයි.
(4) දිළිඳුකමයි. (5) චින්තාවේගයයි.

40. රියසකට කඩ ඇණය මෙන් සමාජයේ යහපැවැත්මට උපයෝගී වන කරුණු හතරක් සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් වෙයි. රාජ්‍ය පාලකයකු තුළද පැවතිය යුතු වූ මෙම කරුණු හතර නම්,

(1) සතර සතිපට්ඨානයයි. (3) සතර සංග්‍රහ වස්තුවයි. (3) සතර බ්‍රහ්ම විහරණයයි.
(4) සතර අගතියයි. (5) සතර සෘද්ධි පාදයයි.

41. පුද්ගල හා සමාජ සුරක්ෂිතතාවය අගය කරන බුදු දහම නිරෝගී පුද්ගලයකු බිහි කිරීමටත්, ධන සම්පත් සුරක්ෂිත කිරීමටත් මත්ද්‍රව්‍ය භාවිතයෙන් වෙන්වීමේ වැදගත්කමක් අවධාරණය කරයි. ඒ අනුව මත්ද්‍රව්‍ය භාවිතයෙන් සිදුවන අයහපත් ප්‍රතිඵල හයට අයත් නොවන්නේ,

(1) නුවණ දුර්වල වීමයි. (2) රෝගාබාධ ඇතිවීමයි. (3) අපකීර්තිය පැතිරීමයි.
(4) අභිධ්‍යාව වර්ධනය වීමයි. (5) ඇස් ඉදිරිපිට ධනය විනාශ වීමයි.

42. බුදුරජාණන් වහන්සේ සෞන්දර්ය අත්විඳි බවට නිදසුන් ලෙස ගත හැකි සූත්‍ර දේශනාවකි.

(1) අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය (2) ව්‍යග්ඝපජ්ජ සූත්‍රය
(3) සාමඤ්ඤඵල සූත්‍රය (4) දම්සක් පැවතුම් සූත්‍රය
(5) අරිය පර්යේෂණ සූත්‍රය

43. බුදු දහමින් උපදෙස් දෙන්නේ දැහැමි රැකියා තුළින් ධනය ඉපයීමටයි. එම අනුමත රැකියා අතරට අයත් නොවන්නකි.

(1) කෘෂිකර්මාන්තය (2) ගවපාලනය (3) සත්ව වෙළඳාම
(4) රාජ්‍ය සේවය (5) විවිධ කර්මාන්තයන්හි යෙදීම

44. ගිහියා ලැබිය යුතු සැප පිළිබඳ අංගුත්තර නිකායේ අණන සූත්‍රයේ සඳහන් කරයි. එහි දැක්වෙන පරිදි "භෝග සුඛය" පැහැදිලි කිරීමට වඩාත් යෝග්‍ය ප්‍රකාශය වන්නේ,

(1) සාධාරණව උපයාගත් භෝග සම්පත් ඇතැයි ලබන සැපයයි.
(2) දැහැමින් ලබන ලද සම්පත් පරිභෝජනයෙන් ලබන සැපයයි.
(3) ණය ඇතිව භෝග සම්පත් උපයා ගැනීමෙන් ලබන සැපයයි.
(4) කයින්, වචනයෙන්, මනසින්,වැරදි නොකර ජීවත්වීමෙන් ලබන සැපයයි.
(5) කිසිවෙකුට ණය නැතිව උපයාගත් භෝග සම්පත් ඇතැයි ලබන සැපයයි.

45. ධන සම්පත් විනාශවීම සඳහා මිත්‍ර ප්‍රතිරූපකයන් ඇසුර බලපාන බව බෞද්ධ මූලාශ්‍රවල සඳහන් වේ. එහි සඳහන් මිත්‍ර ප්‍රතිරූපකයන් සිව්දෙනෙකි. එයට අයත් නොවන්නේ,

(1) අත්ථක්කායි (2) වචී පරම (3) අඤ්ඤදත්ථුහර
(4) අනුප්පියභානි (5) අපායසහාය

46. ලෝභ, දෝෂ, මෝහ, චේතනා පූර්වාංගමව සිදුකරන ක්‍රියා අකුසල් යනුවෙන් බුදු දහමේ හඳුන්වයි. එවැනි අකුසල් දහයක් බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් අතර ඒවායින් කයින් හා මනසින් සිදුවන අකුසල් සංඛ්‍යාව,

(1) තුනකි. (2) හතරකි. (3) පහකි. (4) හයකි. (5) හතකි.

47. රූපාවචර ධ්‍යාන ලබා අනාගාමී තත්වයට පත්ව ධර්ම කථික උපාසකයන් අතර අග්‍ර වූයේ,

(1) අනේපිඬු සිටුතුමාය. (2) නකුලපිතාය. (3) චිත්ත ගෘහපතියාය.
(4) යසකුල පුත්‍රයාගේ පියාය. (5) හල්ලුක උපාසකතුමාය.

48. "නූතන විද්‍යාත්මක චින්තනයට පිළිගත හැකි ආගමක් වේ නම් ඒ බුදු දහමයි." මෙසේ බුදුන් වහන්සේ පිළිබඳව ඇගයීමක් කළේ,

(1) මහාචාර්ය මැක්ස් මුලර් විසිනි (2) ඇල්බට් අයින්ස්ටයින් විසිනි
(3) බර්ට්‍රන්ඩ් රසල් විසිනි (4) එඩ්වින් ආර්නෝල්ඩ් විසිනි
(5) මහාචාර්ය ලක්ස්මි නරසු විසිනි

49. ක්‍රි.පූ.හයවන සියවස වන විට භාරතයෙහි විවිධ ශ්‍රමණ ගුරුකුල පැවතියේය. ඒ අතර ශ්වේතාම්බර හා දිගම්බර වශයෙන් කණ්ඩායම් දෙකක් දැකිය හැකි වූයේ,

(1) නිගණ්ඨයන් අතරය.
(2) ජටිලයන් අතරය.
(3) ආජීවකයන් අතරය.
(4) පරිබ්‍රාජකයන් අතරය.
(5) තාපසවරු අතරය.

50. බුදුන් වහන්සේ හා බිම්බිසාර රජු අතර සමීප සබඳතා පැවතියේ ය. එම රජුගේ ඉල්ලීම පරිදි රාජ භටයන් පැවිදි නොකිරීමටත් අදත්තාදාන පාරාජිකාව පැනවීමටත් තීරණය කළේය. බිම්බිසාර රජු වෙනුවෙන් දේශනා කරන ලද සූත්‍ර දේශනාවකි.

(1) සාමඤ්ඤඵල සූත්‍රය
(2) වසල සූත්‍රය
(3) තිරෝකුඩ්ඩ සූත්‍රය
(4) පරාභව සූත්‍රය
(5) චක්කවත්ති සීහනාද සූත්‍රය

සියලුම හිමිකම් ඇවිරිණි. *All Right Reserved*

බෞද්ධ ශිෂ්ටාචාරය - කලාප අධ්‍යාපන කාර්යාලය බෞද්ධ ශිෂ්ටාචාරය - කලාප අධ්‍යාපන කාර්යාලය බෞද්ධ ශිෂ්ටාචාරය - කලාප අධ්‍යාපන
බෞද්ධ ශිෂ්ටාචාරය - කලාප අධ්‍යාපන කාර්යාලය බෞද්ධ ශිෂ්ටාචාරය - කලාප අධ්‍යාපන කාර්යාලය බෞද්ධ ශිෂ්ටාචාරය - කලාප අධ්‍යාපන
බෞද්ධ ශිෂ්ටාචාරය - කලාප අධ්‍යාපන කාර්යාලය බෞද්ධ ශිෂ්ටාචාරය - කලාප අධ්‍යාපන කාර්යාලය බෞද්ධ ශිෂ්ටාචාරය - කලාප අධ්‍යාපන
බෞද්ධ ශිෂ්ටාචාරය - කලාප අධ්‍යාපන කාර්යාලය බෞද්ධ ශිෂ්ටාචාරය - කලාප අධ්‍යාපන කාර්යාලය බෞද්ධ ශිෂ්ටාචාරය - කලාප අධ්‍යාපන

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2020 - පෙරහුරු ප්‍රශ්න පත්‍ර
General Certificate of Education (Adv. Level) Examination,

බෞද්ධ ශිෂ්ටාචාරය - II

45 S II

පැය තුනයි
Three hours

සැලකිය යුතුයි -: I කොටසින් ප්‍රශ්න 02 ක්ද, II කොටසින් ප්‍රශ්න 03 ක්ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් හිමි වේ.

## I කොටස

01.
- I. චතුර් වර්ණය නම් කරන්න.
- II. ගෘහස්ථ ආශ්‍රමයට අයත් කාර්යයන් කෙටියෙන් දක්වන්න.
- III. පකුධ කච්චායන ශාස්තෘවරයාගේ ඉගැන්වීම් කෙටියෙන් හඳුන්වන්න.
- IV. පකුධ කච්චායනගේ ඉගැන්වීම් පිළිබඳ බුදුසමයේ ආකල්පය සංක්ෂේපයෙන් ඉදිරිපත් කරන්න.
- V. බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රධායේ සුවිශේෂතා කෙටියෙන් ගෙනහැර දක්වන්න.

02.
- I. සතර අගතිය නම් කරන්න.
- II. සම්මා සම්බුද්ධ බුදු ගුණය පිළිබඳ කෙටි විවරණයක් කරන්න.
- III. අනාථපිණ්ඩික සිටුතුමා සතුව පැවති ගුණාංග හතරක් ගෙනහැර දක්වන්න.
- IV. නිදහස් චින්තනයට බුදු දහමින් ලැබෙන පිටිවහල කෙටියෙන් පහදන්න.
- V. ආදර්ශමත් නායකත්වයක් තුළ තිබිය යුතු මූලික ගුණාංග හයක් බුද්ධ චරිතය ඇසුරින් ප්‍රකට කරන්න.

03.
- I. භෝග විනාශ මුඛ හයෙන් හතරක් නම් කරන්න.
- II. "සුකරානි අසාධූනි" .......... යන ගාථාව සම්පූර්ණ කරන්න.
- III. එම ගාථාව අර්ථය නිවැරදිව ලියා දක්වන්න.
- IV. "මෙලොව දියුණුවට මංගල කරුණු" යන්නට කෙටි විවරණයක් සපයන්න.
- V. සුරාපානයෙහි ආදීනව පිළිබඳ සිඟාලෝවාද සූත්‍රයෙහි දැක්වෙන ඉගැන්වීම් පෙන්වා දෙන්න.

## II කොටස

04.
- I. බුදු සමයට අනුව ධනය වනාහි ගොඩගසා ගත යුත්තක් නොව සංසරණ විය යුතු දෙයකි,විමසන්න.
- II. කලා රසවින්දනය සංවේදී මිනිසකු සතු උසස් ගුණාංගයක් බව සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් පැහැදිලි කරන්න.

05.
- I. වර්තමාන පාරිසරික ගැටලු අවමකර ගැනීමට පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අදාළ කරගත හැකි ආකාරය පෙන්වා දෙන්න.
- II. දස සක්විතිවත් වලින් යහපත් පාලන තන්ත්‍රයක් අවධාරණය කොට ඇති බව සාකච්ඡා කරන්න.

06.

I. පළමු ධර්ම සංගායනාව පැවැත්විමට බලපෑ හේතු ගෙන හැර දක්වා එම සංගායනාවේ ප්‍රතිඵල බුදු සසුනෙහි චිරස්ථිතිය සඳහා හේතු වූ ආකාරය සාකච්ඡා කරන්න.

II. ධර්මාශෝක අධිරාජ්‍යා විසින් සිදු කරන ලද ශාසනික මෙහෙය ඓතිහාසික සාධක ඇසුරින් ඇගයීමට ලක් කරන්න.

07.

I. ශ්‍රී ලාංකික රජ දරුවන්ගේ අධ්‍යාත්මය බෞද්ධ සාරධර්ම වලින් පෝෂණය වූ ආකාරය නිදසුන් දක්වමින් ප්‍රකට කරන්න.

II. තායිලන්තයට බුදුදහම හඳුන්වාදීම පිළිබඳව තොරතුරු ගෙන හැර දක්වා තායි ජන ජීවිතයට බුදු සමයෙන් ලැබුණු ආලෝකය සාකච්ඡා කරන්න.

08.

I. බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය පිළිබඳව පවත්නා මතවාද හඳුන්වා දී ගන්ධාර හා මථුරා බුද්ධ ප්‍රතිමාවල සම විෂමතා ගෙනහැර දක්වන්න.

II. බුදුරදුන් පිළිබඳව ශ්‍රද්ධාව ජනනය කිරීම සඳහා බෞද්ධ ගීත සාහිත්‍යයෙන් ලැබෙන අනුබලය නිදර්ශන සහිතව පෙන්වා දෙන්න.